tamilguru.lk

**නැගෙනහිර පළාතේ, පළාත් පාසල්වල පවතින සිංහල හා දෙමළ මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා (2023 හා 2024 වර්ෂයන්හිදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් බඳවාගැනීමට අනුමැතිය ලබා දී තිබූ පුරප්පාඩු සංඛ්‍යාවෙන් ඉතිරි වූ පුරප්පාඩු සඳහා) ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025**

නැගෙනහිර පළාතේ, පළාත් පාසල්වල පවතින සිංහල හා දෙමළ මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා (2023 හා 2024 වර්ෂයන්හිදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් බඳවාගැනීමට අනුමැතිය ලබා දී තිබූ පුරප්පාඩු සංඛ්‍යාවෙන් ඉතිරි වූ පුරප්පාඩු සඳහා) ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගයට මෙම නිවේදනයේ සඳහන් කොන්දේසි සහ සුදුසුකම් සපුරා ඇති නැගෙනහිර පළාතේ ස්ථිර පදිංචි උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය **2025.05.19** දින වේ. මෙම විභාගය, ඉල්ලුම්පත්‍ර භාර ගැනීම අවසන් කළ පසු හැකි තරම් ආසන්න දිනක, නැගෙනහිර පළාතේ නගර තුනකදී, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පවත්වනු ලැබේ.

**01. යෝග්‍යතා ඃ-**

**1.1 සාමාන්‍ය සුදුසුකම්**

1.1.1 ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

1.1.2 යහපත් චරිතයකින් සහ මනා මානසික හා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

1.1.3 **2025.05.19** වන දිනට වයස අවුරුදු **18** ට නොඅඩු සහ වයස අවුරුදු **40** ට නොවැඩි විය යුතුය.

1.1.4

(අ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පූර්වාසන්නයෙන් වන වසර තුන (03) හෝ ඊට වැඩි කාලයක් අඛණ්ඩව නැගෙනහිර පළාතෙහි පදිංචි වී සිටීම.

**හෝ**

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පූර්වාසන්නයෙන් වන වසර තුන (03) හෝ ඊට වැඩි කාලයක් අඛණ්ඩව නැගෙනහිර පළාතෙහි ස්ථිරව පදිංචි වී සිටින අයෙකු සමග ආවාහ/විවාහ වී වෙනත් පළාතක සිට, අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට පෙර මෙම පළාතට පැමිණ පදිංචි වී ඒ බව සනාථ කළ හැකි ලේඛන ඉදිරිපත් කළ හැකි අයෙකු වීම.

සටහනඃ **ඉහත 1.1.4(අ) යටතේ අයදුම්කරන අපේක්ෂකයින් පදිංචිය සනාථ කිරීමට අවසන් දිනයට පූර්වාසන්න වසර 03 සඳහා ලබාගත් ඡන්දහිමි නාමලේඛනයේ සහතික කරන ලද උපුටනය සහ ග්‍රාම නිලධාරී සහතිකය සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු අතර, ඉහත 1.1.4(ආ) යටතේ අයදුම්කරන අපේක්ෂකයින් තමාගේ පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය සහ තම කලත්‍රයාගේ පදිංචිය සනාථ කිරීමට අවසන් දිනයට පූර්වාසන්න වසර 03 සඳහා ලබාගත් ඡන්දහිමි නාමලේඛනයේ සහතික කරන ලද උපුටනය සමග ග්‍රාම නිලධාරී සහතිකයද සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.**

**1.2 අධ්‍යාපන සුදුසුකම්**

1.2.1 ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව **2025.05.19** වන දිනට ඉගැන්වීම් කාර්යයන් සඳහා පිළිගත් සුවිශේෂ කරන ලද ක්ෂේත්‍ර වලට අයත්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක් මගින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මගින් පිරිනමනු ලබන උපාධියක් ලබා තිබිය යුතු අතර එක් එක් විෂය සඳහා මෙම නිවේදනයේ **'උපලේඛන අංක 01'** යටතේ ඇති සුදුසුකම් සපුරා තිබීම

**සහ**

1.2.2 අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී ගණිතය විෂයය සහ සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයයක් වශයෙන් සමත් වී තිබීම අනිවාර්ය වේ.

1.2.3 අ.පො.ස.(උ.පෙළ) විභාගය සමත් වී තිබීම **හෝ** ඊට සමාන සුදුසුකමක් සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

1.2.4 උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන් අනුව පමණක් පුරප්පාඩු පවතින විෂයයන් සඳහා ඉල්ලුම් කළ හැකිය. අයදුම්කරුවන් අදාල විෂයය ප්‍රධාන විෂයයක් වශයෙන් තම උපාධිය සඳහා හදාරා ඇති බවට උපාධියෙහි විස්තරාත්මක ප්‍රතිඵල ලේඛනයෙහි දක්වා නොමැති නම් අයදුම්කරුවන් ඉල්ලා සිටිනු ලබන විෂයය, ප්‍රධාන විෂයයක් වශයෙන් හදාරා ඇති බවට වන තහවුරුවක් අදාල විශ්ව විද්‍යාලය/ආයතනය වෙතින් ලබා ගෙන සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුය.

tamilguru.lk

1.2.5 උපාධියෙහි සඳහන් විෂයය/විෂයයන් සහ අයදුම්කරනු ලබන විෂයය පිළිබඳව ඇති වන ගැටළු සම්බන්ධයෙන් අවසන් තීරණය නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

**02. බඳවාගැනීමේ ක්‍රමය හා සේවා කොන්දේසි ඃ-**

2.1 මෙම තනතුර ස්ථිරය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතුය.

2.2 මෙම බඳවාගැනීම් දිස්ත්‍රික් පදනම මත සිදුකරනු ලැබේ. අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය පළමුව සළකා බැලේ. එනම්, යම් දිස්ත්‍රික්කයක, යම් විෂයයක් සඳහා පවතින පුරප්පාඩු එම දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් පළමුව පුරවනු ලැබේ. එසේම පුරප්පාඩු පිරවීමේදී අදාල විෂයය සඳහා එම දිස්ත්‍රික්කයේ සුදුසුකම් ලත් අයදුම්කරුවන් නොමැති නම් අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති, **'අයදුම්කරනු ලබන දිස්ත්‍රික්ක'** යන කොටසෙහි සඳහන් දිස්ත්‍රික්කයන්ගේ ප්‍රමුඛතා අනුපිළිවෙල සහ ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව අනෙකුත් දිස්ත්‍රික්කයන්හි අයදුම්කරුවන් සඳහා පත්වීම් ලබාදීමට සලකා බලනු ලැබේ.

2.3 එක් එක් දිස්ත්‍රික්කයෙහි ඒ ඒ විෂයන් සඳහා වන පුරප්පාඩු සංඛ්‍යාවද **'උපලේඛන 01'**හි සඳහන් කර තිබේ. ඒ අනුව අයදුම්කරුවන්ගේ කුසලතා අනුපිළිවෙළ මත සහ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මත ඔවුන් 'උපලේඛන 01'හි සඳහන් දිස්ත්‍රික්කයන්හි පුරප්පාඩු පවතින අධ්‍යාපන කලාප වෙත පත්කිරීම සිදුකරනු ලැබේ. කුසලතා අනුපිළිවෙළ මත, ලබා දෙන කලාපය තුළ සේවය කිරීම අනිවාර්යය වන අතර කිසිදු හේතුවක් මත වෙනත් කලාපයක් සඳහා පත්වීමක් ලබා දෙනු නොලැබේ.

2.4 මුලින් පත්වීම් ලබන පාසලේ වසර 08 ක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතු අතර කිසිදු හේතුවක් මත ස්ථාන මාරුවීම් සඳහා කෙරෙන ඉල්ලීම් සලකා බලනු නොලැබේ. මේ පිළිබඳව සේවා ගිවිසුමක් නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සමග ඇති කර ගැනීමට එකඟ විය යුතුය.

2.5 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංකඃ 1885/38, දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.3.4 හි සඳහන් විධිවිධාන අනුව බඳවා ගැනීම් සිදු කරනු ලබන අතර, උසස්වීම් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාරව සිදුකරනු ඇත.

2.6 රජයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය මගින් පනවා ඇති කොන්දේසිවලටද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලටද යටත්ව, තෝරා ගනු ලබන උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට පත්කරනු ලැබේ. මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංකඃ 10/2025 හි **G.E.-1-2025** දරණ වැටුප් බණ්ඩය යටතේ මාසිකව **රු. 53,060-800x6 - 940x7 - 1080x2 - රු. 66,600/-** වේ. උපාධිධාරීන් මෙම වැටුප් පරිමාණයේ 14 වන වැටුප් පියවර වන **රු.64,440/-** වැටුපෙහි පිහිටුවනු ලබන අතර එම චක්‍රලේඛයෙහි **'උපලේඛන III'** අනුව වැටුප් ගෙවනු ලැබේ.

2.7 මෙම දැන්වීමට අදාළව පුරප්පාඩු පවතින විෂයයන් සඳහා ඉල්ලුම් කරනු ලබන අයදුම්කරුවන් වෙනුවෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලිඛිත තරග විභාගයක් පවත්වනු ලැබේ. මෙම ලිඛිත තරග විභාගයෙන් සමත් වන අයදුම්කරුවන්ගේ ලකුණු කුසලතා අනුපිළිවෙල මත සහ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.) සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබූවන්ගේ නාමලේඛනය නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ පළ කිරිමට කටයුතු කරනු ලැබේ. නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කාර්යය පරිපාටික රීති සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 63 වන වගන්තිය අනුව ලිඛිත තරඟ විභාගය සහ ප්‍රායෝගික පරීක්ෂණයේ ප්‍රතිඵල, පත්කිරීම් පිළිබඳව අවසන් තීරණයක් ගන්නා තෙක් ප්‍රසිද්ධ කරනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී බඳවා ගැනීමේ සුදුසුකම් සනාථ කරනු ලබන අයදුම්කරුවන් පමණක් එදිනම ප්‍රායෝගික පරීක්ෂණය සඳහා යොමු කරනු ලැබේ. ලිඛිත තරඟ විභාගයෙන් ලබා ගන්නා ලකුණුවල හා ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලබා ගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩු ප්‍රමාණය අනුව බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

2.8 මෙම නිවේදනයට අනුව බඳවා ගනු ලබන සෑම අයදුම්කරුවෙකුටම සේවාරම්භක පුහුණුවක් (Pre-Service Training) ලබා දෙනු ලැබේ.

2.9 අයදුම්කරනු ලබන විෂයය කිසිසේත්ම වෙනස් කරනු නොලබන අතර, ඒ පිළිබඳව ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව ද සලකා බලනු නොලැබේ.

2.10 සෑම අයදුම්කරුවෙකුම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර තනතුරට අදාළ සියළුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර ඉල්ලා ඇති සුදුසුකම් වලට අදාළ පරීක්ෂණවල ප්‍රතිඵල ද නිලවශයෙන් නිකුත් වී තිබිය යුතුය. ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින අය අයදුම් කිරීම වරදක් සේ සලකනු ලබන අතර, සුදුසුකම් නොමැතිව එවනු ලබන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.11 එමෙන්ම මෙම නිවේදනයෙන් ආවරණය නොවන යම් කරුණක් වෙතොත් එම කරුණු සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට යටත්වනු ඇත.

**03. අයදුම්කිරීමේ ක්‍රමය ඃ-**

3.1 මෙම දැන්වීමෙහි අවසානයේ යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4(සෙ.මී.21x29) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම **පමණක්** ප්‍රයෝජනයට ගනිමින් **අංක 1.0 සිට 5.2 දක්වා පළමු පිටුවටද, අංක 5.3 සිට 11.0 දක්වා දෙවන පිටුවටද** ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතුය.

3.2 **නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නිවැරදිව සම්පූර්ණ කර නොමැති, ආදර්ශ අයදුම්පත්‍රයේ ඇති විභාග සංකේත අංකය නොමැති, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති, අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ ඒදිනට පෙර ඉදිරිපත් කර නොමැති අයදුම්පත් සහ අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.** නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන අලාභය අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු සැලකිලිමත් විය යුතුය. එසේ නොවුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

3.3 **'උපලේඛන 01'** යටතේ සඳහන් විෂයයන් සඳහා අවශ්‍ය වන අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා කර, ඔබගේ උපාධියට අදාල විෂයයන් සඳහා පමණක් අයදුම්පත් යොමු කළ යුතු වේ. එක් අයදුම්කරුවෙකුට **විෂයන් 02ක්** සඳහා අයදුම් කළ හැකි අතර අයදුම් කරනු ලබන විෂයය හා විෂයය අංකය නිවැරදිව අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ සඳහන් කළ යුතුය. අයදුම්කරුවන් විසින් තම විස්තරාත්මක ප්‍රතිඵල සහතිකයේ (Academic Transcript) හෝ උපාධි සහතිකයේ සහතික කරන ලද පිටපතක් අයදුම්පත්‍රය සමග අමුණා එවීම අනිවාර්යය වන අතර, එසේ අමුණා එවනු නොලබන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් පසුව ඉදිරිපත් කරන ඉල්ලීම් හෝ පැමිණිලි සළකා බලනු නොලැබේ.

3.4 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය අයදුම්පතෙහි පැහැදිලිව සඳහන් කළ යුතු අතර අදාල දිස්ත්‍රික්කයෙහි පුරප්පාඩු නොමැති අවස්ථාවක වෙනත් දිස්ත්‍රික්කයක සේවය කිරීමට මනාප නම් එම දිස්ත්‍රික්ක 2 අනුපිළිවෙළින් අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතුය.

3.5 අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු/ කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීවරයකු/සාමදාන විනිශ්වයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු/පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරණ නිලධාරියකු/රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර තනතුරක් දරන රු.41,580/- ක් හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු/බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තනතුරක් දරන අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

3.6 මධ්‍යම රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන තම ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කරනු ලැබ තිබිය යුතුය.

3.7 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2025.05.19** වන දිනට හෝ ඒදිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ තැපෑලෙන් එවන ලද අයදුම්පත් නැතිවුවහොත් ඒ පිළිබඳ වගකීම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් භාර ගනු නොලැබේ.**(අයදුම්පත් ලේකම්වරයාගේ පෞද්ගලික නමට එවීමෙන් වැලකිය යුතුය.)**

ලේකම්,  
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,  
නැගෙනහිර පළාත,  
කන්නියා පාර, වරෝදය නගර්, ත්‍රිකුණාමලය.

3.8 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**EX/Rec/25/01**" යන්න සඳහන් කළ යුතුය.

**04. විභාගයට පෙනී සිටීම ඃ-**

4.1 මෙම නිවේදනයෙහි සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඒදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත මෙම විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ.

4.2 විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත තම අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

4.3 අපේක්ෂකයා, තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම තම ප්‍රවේශ පත්‍රයෙහි අත්සන සහතික කරවාගෙන විභාගය පවත්වනු ලබන දින එහි ශාලාධිපති වෙත භාරදිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට අපේක්ෂකයාට සිදුවනු ඇත.

**05. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව ඃ-**

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත.
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය.

**06. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම ඃ-**

අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් අසත්‍ය බව පෙනී ගියහොත් ඕනෑම අවස්ථාවකදී ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන.

**07. විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය ඃ-**

මෙම තරඟ විභාගය සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු භාෂා මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**08. විෂයය නිර්දේශය ඃ-**

**8.1 ලිඛිත විභාගය**

මෙම විභාගයට නියමිත ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව දෙකකි. එම ප්‍රශ්න පත්‍ර දෙකම පහත සඳහන් පරිදි බහුවරණ හා කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නවලින් සමන්විත වේ. සියලුම අයදුම්කරුවන් මෙම ප්‍රශ්නපත්‍ර සඳහා පෙනී සිටීම අනිවාර්ය වේ. විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍ර සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් ලබාගත යුතුවේ.

**01. අභියෝග්‍යතාවය -** කාලය පැය 01 යි (ලකුණු 100 යි)

අපේක්ෂකයා සතු ගුරු වෘත්තීය සඳහා වන කුසලතා සහ තර්කානුකූල බුද්ධිය තීරණ ගැනීමේ හැකියාව මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි.

**02. සාමාන්‍ය දැනුම -** කාලය පැය 01 යි (ලකුණු 100 යි)

ගුරු ක්ෂේත්‍රයට අදාළව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම හා /හෝ දේශීය වශයෙන් සිදු වී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

**8.2 ප්‍රායෝගික පරීක්ෂණය**

8.2.1 සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් අයදුම්කරු විසින් පත්වීම් ලබා ගැනීමට අපේක්ෂා කරන විෂයයකට අදාලව හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ විනාඩි 05 ක ඉදිරිපත් කිරීමක් කළ යුතුය. මේ සඳහා පහත පරිදි ලකුණු හිමිවේ.

| ප්‍රායෝගික පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| (i) අරමුණ හා ප්‍රවිශ්ඨ වීම | 05 | 02 |
| (ii) පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| (iii) සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| (iv) කාල කළමනාකරණය | 05 | 02 |
| (v) ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම | 05 | 02 |
| ***මුළු ලකුණු ප්‍රමාණය*** | ***25*** | ***10*** |

**09.** විභාග ගාස්තු :-

9.1 විභාග ගාස්තුව රු. 1000/- කි. මෙම මුදල අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ එදිනට පෙර ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත නමට නැගෙනහිර පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන ලදුපත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (ලදුපතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගැනීම සුදුසුය.) කුමන හේතුවක් නිසාවත් ගෙවන ලද විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මෙම ගාස්තුව වෙනත් විභාගයකට මාරු කිරීමටද ඉඩ දෙනු නොලැබේ. **එසේම මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.**

9.2 විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යවනු ලබන අතර, www.ep.gov.lk වෙබ් අඩවියේද ප්‍රසිද්ධ කරනු ඇත.

**10.** විභාගය පැවැත්වීම සඳහා යෝජිත ප්‍රධාන නගර හා එහි අංකයන් පහත සඳහන් වේ.

| <u>නගරය</u> | <u>නගර අංකය</u> |
|---|---|
| ත්‍රිකුණාමලය | 01 |
| මඩකලපුව | 02 |
| අම්පාර | 03 |

**සැ.යු. යම් නගරයකට ඉල්ලුම් කළ අයදුම්කරුවන් ගණන ප්‍රමාණවත් නොවේ නම් අයදුම්පතෙහි සඳහන් නගරයට යාබද නගරයක් වෙත යොමු කරනු ලැබේ.**

**11.** සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් සඳහා වෙනත් දිනයකදී සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

**12.** තම සුදුසුකම් සනාථ කිරීමට අදාළ සියලු ලියකියවිලි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන දිනයේදීම ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේදී ඉල්ලා ඇති නමුත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන සහතික සම්බන්ධයෙන් පසුව සලකා බලනු නොලැබේ.

**13.** මෙම නිවේදනයෙහි සඳහන් විධිවිධානවල කිසියම් සංශෝධනයක් අවශ්‍ය වුවහොත් ඒ සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගන්නා තීරණය අවසාන තීරණය වේ. එමෙන්ම මෙම විභාගය යම් විශේෂ හේතුවක් මත නොපැවැත්වීමේ අවශ්‍යතාවයක් පැන නැගුනහොත් ඒ පිළිබඳව ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ. තවද මෙම පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණයෙන් පිරවීම, කොටසක් පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසාන තීරණය ගැනීමේ බලයද, උපාධියක වලංගුභාවය සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීමේ අයිතිය ද, නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**ජේ. ලියාකත් අලි,**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත.
ත්‍රිකුණාමලය.

දිනය : 2025.04.17

tamilguru.lk

## උපලේඛනය 01 - විෂයය පුරප්පාඩු ලේඛනය

| විෂයය අංකය | විෂයය | අධ්‍යාපන සුදුසුකම් | මාධ්‍යය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | අම්පාර | | මඩකලපුව | ත්‍රිකුණාමලය | | විෂයය සඳහා වන සම්පූර්ණ පුරප්පාඩු සංඛ්‍යාව |
| | | | සිංහල | දෙමළ | දෙමළ | සිංහල | දෙමළ | |
| 01 | ප්‍රාථමික (Primary) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් සිංහල/දෙමළ භාෂාව හෝ සිංහල/දෙමළ වාග් විද්‍යාව / මනෝවිද්‍යාව / දර්ශනය / සමාජ විද්‍යාව විෂයයෙන් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම.<br>**හෝ**<br>පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඕනෑම උපාධියක් සමග අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් අවම වශයෙන් සිංහල/දෙමළ භාෂාව විෂයට B සාමාර්ථයක්ද, ගණිතය විෂයට C සාමාර්ථයක්ද ඉංග්‍රීසි විෂයට S සාමාර්ථයක්ද ලබා තිබිය යුතුය. | 1 | 2 | 3 | 1 | 6 | 13 |
| 02 | විද්‍යාව (Science) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඕනෑම විද්‍යාවේදී උපාධියක් ලබා තිබිය යුතුය. එසේම අ.පො.ස. උ/පෙළ විභාගයෙන් භෞතික විද්‍යා අංශයෙන් හෝ ජීව විද්‍යා අංශයෙන් සමත් වී තිබිය යුතුය. | 1 | - | - | - | 1 | 2 |
| 03 | ඉංග්‍රීසි (English) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව හදාරා ඇති උපාධියක් /ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය/ඉංග්‍රීසි වාග් විද්‍යාව/ඉංග්‍රීසි පිළිබඳ TESL (Teaching English as a Second Language) විෂයයෙන් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබිය යුතුය.<br>**හෝ**<br>ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබාගත් ඕනෑම උපාධියක් සමග රජයේ පිළිගත් ආයතනයකින් HNDE (Higher National Diploma in English) උසස් ජාතික ඩිප්ලෝමාව ලබා තිබිය යුතුය. | 4 | - | 2 | 1 | - | 7 |
| 04 | චිත්‍ර කලාව (Art) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් චිත්‍ර/ශිල්ප කලා විෂයයෙන් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබිය යුතුය. | 2 | - | - | - | - | 2 |
| 05 | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය (Health and Physical Education) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය විෂයයෙන් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබිය යුතුය.<br>**හෝ**<br>ඕනෑම උපාධියක් සමග ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ අනුමැතිය ලත් ක්‍රීඩා පිළිබඳ වසරකට නොඅඩු ඕනෑම ඩිප්ලෝමාවක් සම්පූර්ණ කර තිබිය යුතුය. | - | - | - | 1 | - | 1 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 06 | පුස්තකාල කටයුතු භාර ගුරුවරුන් (Library in-charge Teachers) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් පුස්තකාල විද්‍යාව පිළිබඳ විෂයකින් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව උපාධියක් ලබා තිබීම.<br>**හෝ**<br>පුස්තකාල විද්‍යාව පිළිබඳ ඕනෑම සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබිය යුතුය.<br>**හෝ**<br>ඕනෑම උපාධියක් සමග ජාතික පුස්තකාල හා තොරතුරු විද්‍යායතනයෙන් ලබාගත් පුස්තකාල විද්‍යා ඩිප්ලෝමාවක් ලබා තිබිය යුතුය. | - | 1 | - | - | - | 1 |
| 07 | රසායන විද්‍යාව (Chemistry) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් රසායන විද්‍යාව විෂයයෙන් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව උපාධියක් ලබා තිබීම. | - | 1 | 1 | - | 1 | 3 |
| 08 | භෞතික විද්‍යාව (Physics) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් භෞතික විද්‍යාව විෂයයෙන් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව උපාධියක් ලබා තිබීම. | - | 2 | 1 | 3 | 2 | 8 |
| 09 | ජීව විද්‍යාව (Biology) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ජීව විද්‍යාව/ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයයෙන් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව උපාධියක් ලබා තිබීම. | - | 1 | - | 1 | 1 | 3 |
| 10 | කෘෂි විද්‍යාව (Agriculture Science) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් කෘෂි විද්‍යාව පිළිබඳ විෂයයෙන් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව උපාධියක් ලබා තිබීම. | 3 | - | 1 | - | - | 4 |
| 11 | සංයුක්ත ගණිතය (Combined Maths) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම ගණිතය පිළිබඳ විෂයයකින් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව උපාධියක් ලබා තිබිය යුතුයි සහ අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී භෞතික විද්‍යා අංශයෙන් සමත් වී තිබිය යුතුය. | - | 1 | 2 | 1 | - | 4 |
| 12 | ඉංජිනේරු තාක්ෂණවේදය (Engineering Technology) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංජිනේරු තාක්ෂණවේදය පිළිබඳ විෂයකින් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව උපාධියක් ලබා තිබිය යුතුය. සහ අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී ඉංජිනේරු තාක්ෂණවේදය විෂයයෙන් සමත් වී තිබිය යුතුය. | - | 3 | 6 | 1 | 1 | 11 |
| 13 | ජෛව පද්ධති තාක්ෂණවේදය (Bio-System Technology) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ජෛව පද්ධති තාක්ෂණවේදය පිළිබඳ විෂයයෙන් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව උපාධියක් ලබා තිබිය යුතුය. සහ අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී ජීව විද්‍යාව/කෘෂි විද්‍යාව/ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයයෙන් සමත් වී තිබිය යුතුය. | - | 2 | - | - | - | 2 |
| 14 | තාක්ෂණවේදය සඳහා විද්‍යාව (Science for Technology) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් තාක්ෂණවේදය සඳහා විද්‍යාව/ව්‍යවහාරික විද්‍යාවේදී උපාධිය/විද්‍යාවේදී උපාධියක් සමග ඕනෑම විෂයයක අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව උපාධියක් ලබා තිබිය යුතුය. සහ අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් තාක්ෂණවේදය සඳහා විද්‍යාව/කෘෂි විද්‍යාව විෂයයෙන් සමත් වී තිබිය යුතුය. | - | 2 | 3 | 2 | - | 7 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 15 | සාමාන්‍ය ඉංග්‍රීසි (General English ) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව හදාරා ඇති උපාධියක් /ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය/ඉංග්‍රීසි වාග් විද්‍යාව/ඉංග්‍රීසි පිළිබඳ TESL (Teaching English as a Second Language) විෂයයෙන් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබිය යුතුය.<br>**හෝ**<br>ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබාගත් ඕනෑම උපාධියක් සමග රජයේ පිළිගත් ආයතනයකින් HNDE (Higher National Diploma in English) උසස් ජාතික ඩිප්ලෝමාව ලබා තිබිය යුතුය. | 35 | 49 | 72 | 20 | 50 | 226 |
| 16 | ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා (Physical Education & Sports) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය විෂයයෙන් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව උපාධියක් ලබා තිබීම.<br>**හෝ**<br>ඕනෑම උපාධියක් සමග ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ අනුමැතිය සහිතව ලබාගත් ක්‍රීඩා පිළිබඳ වසරකට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබිය යුතුය. | - | - | - | 2 | - | 2 |
| 17 | ප්‍රාසාංගික කලා (Performing Arts) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ප්‍රාසාංගික කලාව පිළිබඳ විෂයකින් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබිය යුතුය.<br>**හෝ**<br>නාට්‍ය හා රංගකලාව/ශිල්පකලා පිළිබඳ උපාධියක් රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් ලබා තිබිය යුතුය. | - | - | - | 1 | - | 1 |
| 18 | කාර්ය සිද්ධි කළමනාකරණය (Event Management) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් කාර්ය සිද්ධි කළමනාකරණය/ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ විෂයකින් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම. | - | - | 2 | - | - | 2 |
| 19 | උසස් පෙළ - ශිල්ප කලා (A/L - Arts & Crafts) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් චිත්‍ර හා ශිල්ප කලා පිළිබඳ විෂයකින් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබිය යුතුය. | - | - | 1 | - | - | 1 |
| 20 | විලාසිතා නිර්මාණකරණය (Fashion Designing) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් විලාසිතා නිර්මාණකරණය පිළිබඳ විෂයකින් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව උපාධියක් ලබා තිබිය යුතුය.<br>**හෝ**<br>ඕනෑම ශාස්ත්‍රවේදී උපාධියක් සහිතව SLITA/ඕනෑම ආයතනයකින් වසරකට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබිය යුතුය. | - | - | 1 | 1 | 1 | 3 |
| 21 | භූ දර්ශන නිර්මාණකරණය (Landscaping) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් භූ දර්ශන නිර්මාණකරණය පිළිබඳ විෂයකින් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම. | 1 | 1 | 1 | 1 | - | 4 |
| 22 | ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණ අධ්‍යයනය (Applied Horticultural Studies) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණ අධ්‍යයනය පිළිබඳ විෂයකින් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව උපාධියක් ලබා තිබීම. | - | - | - | 1 | - | 1 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 23 | පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය (Livestock Product Studies) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් පශු සම්පත් නිෂ්පාදන/සත්ත්ව පාලනය පිළිබඳ විෂයකින් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව උපාධියක් ලබා තිබීම. | - | - | 1 | - | 1 | 2 |
| 24 | ආහාර නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය (Food Processing Studies) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ආහාර සැකසීම/ආහාර තාක්ෂණය/කෘෂි විද්‍යාව/ආහාර හා පෝෂණය/ආහාර නිෂ්පාදනය පිළිබඳ විෂයකින් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව උපාධියක් ලබා තිබීම. | 1 | - | - | - | - | 1 |
| 25 | ජලජ සම්පත් තාක්ෂණ අධ්‍යයනය (Aquatic Resources Technology Studies) | පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් ජලජ ජීව සම්පත් පිළිබඳ විෂයකින් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව උපාධියක් ලබා තිබීම. | 1 | - | 1 | - | - | 2 |
| 26 | වැවිලි භෝග නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය (Plantation Product Studies) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් වැවිලි භෝග නිෂ්පාදන/කෘෂි විද්‍යාව පිළිබඳ විෂයකින් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව උපාධියක් ලබා තිබීම. | 1 | - | - | - | - | 1 |
| 27 | ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය (Construction Studies) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ විෂයකින් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව උපාධියක් ලබා තිබිය යුතුය.<br>**හෝ**<br>ඕනෑම උපාධියක් සහිතව අ.පො.ස උසස් පෙළ විභාගයේදී ඉංජිනේරු තාක්ෂණවේදය විෂයයෙන් සමත් වී තිබිය යුතු අතර NVQ 4 ට වැඩි ඉදිකිරීම් තාක්ෂණවේදය පිළිබඳ ඩිප්ලෝමාවක් රජයේ අනුමත ආයතනයකින් ලබා තිබිය යුතුය. | - | - | 1 | 1 | - | 2 |
| 28 | මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය (Automobile Studies) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය පිළිබඳ විෂයයෙන් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව උපාධියක් ලබා තිබිය යුතුය.<br>**හෝ**<br>ඕනෑම උපාධියක් සමග රජයේ අනුමත ආයතනයකින් මෝටර් යාන්ත්‍රික තාක්ෂණය පිළිබඳ විෂයකින් වසරකට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබිය යුතුය. | 1 | 1 | 4 | - | 3 | 9 |
| 29 | විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය (Electrical & Electronic Studies) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය පිළිබඳ විෂයකින් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව උපාධියක් ලබා තිබීම.<br>**හෝ**<br>ඕනෑම උපාධියක් සමග රජයේ අනුමත ආයතනයකින් විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය පිළිබඳ විෂයකින් වසරකට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබිය යුතුය. | 1 | - | - | 2 | 1 | 4 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 30 | පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනය (Textile & Apparel Studies) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් පේෂකර්ම හා ඇඟළුම් තාක්‍ෂණ අධ්‍යයනය පිළිබඳ විෂයකින් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව උපාධියක් ලබා තිබීම.<br>**හෝ**<br>ඕනෑම උපාධියක් සමග රජයේ අනුමත SLITA/ ඕනෑම ආයතනයකින් පේෂකර්ම හා ඇඟළුම් තාක්‍ෂණ අධ්‍යයනය පිළිබඳ විෂයකින් වසරකට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබිය යුතුය. | 1 | - | 2 | - | 1 | 4 |
| 31 | ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය (Metal Fabrication Studies) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලෝහ සැකසුම් තාක්‍ෂණ අධ්‍යයනය පිළිබඳ විෂයකින් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව උපාධියක් ලබා තිබීම.<br>**හෝ**<br>ඕනෑම උපාධියක් සමග රජයේ අනුමත ආයතනයකින් ලෝහ සැකසුම් තාක්‍ෂණ අධ්‍යයනය පිළිබඳ විෂයකින් වසරකට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබිය යුතුය. | - | 3 | 1 | - | - | 4 |
| 32 | ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය (Aluminium Fabrication Studies) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඇලුමිනියම් පිරිසැකසුම් තාක්‍ෂණ අධ්‍යයනය පිළිබඳ විෂයකින් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව උපාධියක් ලබා තිබීම.<br>**හෝ**<br>ඕනෑම උපාධියක් සමග රජයේ අනුමත ආයතනයකින් ඇලුමිනියම් පිරිසැකසුම් තාක්‍ෂණ අධ්‍යයනය පිළිබඳ විෂයකින් වසරකට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබිය යුතුය. | - | 1 | 1 | 1 | 1 | 4 |
| 33 | පරිගණක දෘඩාංග හා ජාලකරණය - වෙබ් නිර්මාණය හා මෘදුකාංග සංවර්ධනය (Computer Hardware & Networking - Web Designing & Software Development ) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක දෘඩාංග හා ජාලකරණය පිළිබඳ විෂයකින් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව උපාධියක් ලබා තිබීම.<br>**හෝ**<br>ඕනෑම උපාධියක් සමග රජයේ අනුමත ආයතනයකින් පරිගණක දෘඩාංග හා ජාලකරණය පිළිබඳ විෂයකින් වසරකට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබිය යුතුය. | - | - | 1 | - | - | 1 |
| 34 | නිෂ්පාදනය (Manufacturing) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් නිෂ්පාදනය පිළිබඳ විෂයකින් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව උපාධියක් ලබා තිබීම.<br>**හෝ**<br>ඕනෑම උපාධියක් සමග රජයේ අනුමත ආයතනයකින් නිෂ්පාදනය පිළිබඳ විෂයකින් වසරකට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබිය යුතුය. | - | 2 | 2 | - | - | 4 |
| 35 | විශේෂ අධ්‍යාපනය (Special Education) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් විශේෂ අධ්‍යාපනය පිළිබඳ විෂයකින් අවම වශයෙන් සම්මාන 30 ක් (Credits) සහිතව උපාධියක් ලබා තිබීම.<br>**හෝ**<br>විශේෂ අධ්‍යාපනය පිළිබඳ ඕනෑම උපාධියක්/කථන හා ශ්‍රවණවේදය පිළිබඳ විද්‍යාවේදී උපාධියක්/මනෝ විද්‍යාව/ මනෝ විද්‍යාව හා අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ සම්මාන 30 ක් (Credits) සහිතව උපාධියක් රජයේ අනුමත ආයතනයකින් ලබා තිබිය යුතුය. | 7 | 14 | 16 | - | 5 | 42 |
| | | | | | | | ***සම්පූර්ණ පුරප්පාඩු සංඛ්‍යාව*** | **388** |

**EX/Rec/25/01**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

ආදර්ශ අයදුම්පත්‍රය

**නැගෙනහිර පළාතේ, පළාත් පාසල්වල පවතින සිංහල හා දෙමළ මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා (2023 හා 2024 වර්ෂයන්හිදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් බඳවාගැනීමට අනුමැතිය ලබා දී තිබූ පුරප්පාඩු සංඛ්‍යාවෙන් ඉතිරි වූ පුරප්පාඩු සඳහා) ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025**

**විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය**
සිංහල - S දෙමළ - T
*(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)*

**විභාගයට ඉදිරිපත් වන නගරයේ අංකය**
*(10 වැනි ඡේදයේ සඳහන් නගර අංකය ලියන්න.)*

**ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය** : ........................................................

**දිස්ත්‍රික්කය තුළ පදිංචි කාලසීමාව(අවුරුදු)** : .......................

ඉල්ලුම් කරනු ලබන විෂයය : *(උපලේඛන 01 අනුව යොදන්න)*

| විෂයය | විෂයය අංකය |
|---|---|
| | |
| | |

අයදුම්කරනු ලබන දිස්ත්‍රික්ක : 1. ................................................

2. ................................................

---

**1.0** 1.1 මුලකුරු සමඟ නම : Rev/Mr/Mrs/Miss ...................................................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් අගට යෙදෙන නම මුලින් ලියා මුලකුරු පසුව ලියන්න - උදා : PERERA, A.B.C.)*

1.2 මුලකුරු වලින් හැඳින්වෙන නම් : ........................................................................................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ........................................................................................................

1.3 සම්පූර්ණ නම : ........................................................................................................
*(සිංහලෙන්/දෙමළෙන්)* ........................................................................................................

1.4 ස්ත්‍රී/පුරුෂ භාවය ස්ත්‍රී - F පුරුෂ - M
*(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)*

1.5 දුරකතන අංකය : ........................................................................................................

**2.0** 2.1 ස්ථිර ලිපිනය : ........................................................................................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ........................................................................................................

2.2 ස්ථිර ලිපිනය : ........................................................................................................
*(සිංහලෙන්/දෙමළෙන්)* ........................................................................................................

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය : ........................................................................................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ........................................................................................................

**3.0** 3.1 ජාතික හැඳුනුම්පත් අංකය

3.2 උපන් දිනය : වර්ෂය මාසය දිනය

3.3 **2025.05.19** දිනට වයස : වර්ෂ මාස දින

**4.0** ජනවර්ගය : සිංහල ශ්‍රී ලාංකික දෙමළ මුස්ලිම් වෙනත්
*(අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න)*

**5.0** අධ්‍යාපන සුදුසුකම්

5.1 අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර

(i) විභාගයේ වර්ෂය : ...........................................

(ii) විභාග අංකය : ...........................................

(iii) ප්‍රතිඵල

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.2 අ.පො.ස. (උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර

(i) විභාගයේ වර්ෂය : ...........................................

(ii) විභාග අංකය : ...........................................

(iii) ප්‍රතිඵල

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 3. | |
| 2. | | 4. | |

5.3 උපාධිය පිළිබඳ විස්තර

5.3.1 උපාධිය : .................................................................................................................

5.3.2 විශ්ව විද්‍යාලය/ ආයතනයේ නම : .........................................................................................

5.3.3 උපාධිය වලංගු වන දිනය : ......................................................................................................

5.3.4 උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන් : ............................................................................

5.3.5 උපාධි වර්ගය : අභ්‍යන්තර ( ) බාහිර ( ) *(අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න)*

5.4 ඩිප්ලෝමාව පිළිබඳ විස්තර

5.4.1 ඩිප්ලෝමාව : .................................................................................................................

5.4.2 ආයතනයේ නම : .................................................................................................................

5.4.3 ඩිප්ලෝමාව වලංගු වන දිනය: ......................................................................................................

5.4.4 ඩිප්ලෝමා කාල සීමාව : ...............................................................................................................

**6.0** රාජ්‍ය/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයෙකු නම් ඃ-

6.1 දෙපාර්තමේන්තුව/කාර්යාලය : .......................................................................................

6.2 වර්තමාන තනතුර : .......................................................................................

6.3 තනතුරෙහි ස්ථිර කළ දිනය : .......................................................................................

6.4 මුල්පත්වීම් දිනය : .......................................................................................

**7.0** ඔබ ශ්‍රී ලංකාවේ උසාවියකින් කවර හෝ අපරාධ වරදකට වරදකරු කරනු ලැබ තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න. : .......................................................................................................................................................

**8.0** විභාග ගාස්තු ගෙවූ (පැහැදිලි විස්තර සහිත) ලදුපත අදාළ කොටුව තුළ නොගැලවෙන සේ ඇලවිය යුතුය.

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

**9.0 අයදුම්කරුගේ සහතිකය**

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඇ) තවද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය : ....................................... ...........................................

අයදුම්කරුගේ අත්සන

**10.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම** *(මෙම දැන්වීමෙහි 3.5/3.6 අනුව)*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ............................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, සහතික කරමි.

දිනය : ................................ ................................................................................

අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම: ........................................................................

තනතුර : ............................................................................

ලිපිනය : ............................................................................

(*නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.*)

**11.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය** *(මධ්‍යම රජයේ/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා පමණි)*

මෙම දෙපාර්තමේන්තුවේ ස්ථිර නිලධාරියෙකු වශයෙන් ................................. තනතුරෙහි සේවය කරන ................................................. මයා/මිය/මෙනවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු/ඇය තම සේවා කාලය තුළ කිසිඳු විනයානුකූල කටයුත්තකට භාජනය නොවූ බවත්, හැසිරීම සතුටුදායක බවත්, මෙහි ඔහු/ඇය විසින් සඳහන් කර ඇති විස්තර ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව සත්‍ය බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි බවත් දන්වමි.

දිනය : .............................. ......................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

නම : ............................................................................

පදවි නාමය : ............................................................................

ලිපිනය : ............................................................................

(*නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.*)